# 1956යේ අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත.

1957

ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

කොළඹ ආණ්ඩුවේ ග්‍රන්ථ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල: ශත [illegible]යි    තැපැල් ගාස්තුව: ශත 10යි

# 1956යේ අංක 21 දරන පුරාවිද්‍යා ද්‍රව්‍ය ආඥාපනත.

පුරාවිද්‍යා ද්‍රව්‍ය පාලනය කිරීම ද, පුරාවිද්‍යා ද්‍රව්‍යයක් සෑදීම, මෙරටට ගෙන්වීම, සවාමින්වයේ තබා ගැනීම, විකිණීම, සැපයීම, මිලට ගැනීම, පාවිච්චි කිරීම හා ගෙන යාම තහනම් කිරීම කළ හැකිවීම ද, පුරාවිද්‍යා ද්‍රව්‍ය (පැරණි) ආඥාපනත අවලංගු කිරීම ද සඳහා පනවන ලද ආඥාපනතකි.

(අනුමත කළේ : 1956 යේ පෙබරවාරි 17 වෙනිද)

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය, අනුමතිය හා එහි බලය ප්‍රකාර අත්‍යුත්තම මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ.

1. (1) මෙම ආඥාපනත 1956යේ අංක 21 දරන පුරාවිද්‍යා ද්‍රව්‍ය ආඥාපනත නමින් හැඳින්විය හැකි ය.

(2) (3) වෙනි උප වගන්තියේ සඳහන් විධිවිධානවලින් බාහිර වූ මෙම ආඥාපනතේ විධිවිධාන ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් නියම කරනු ලබන (මින්මතු "නියමිත දිනය" යන්නෙන්, සඳහන් කරනු ලබන) දිනයක වලංගු වන්නේ ය.

(3) මෙම වගන්තියේ ද, 2, 3 (1), 6, 11, 13, 14, 15, 16, 19, 22 32, 33 සහ 37 වෙනි වගන්තිවල ද විධිවිධාන මෙම ආඥාපනත පාර්ලිමේන්තුවේ ආඥාපනතක් වූ විටක, වලංගු වන්නේ ය.

## I වෙනි කාණ්ඩය.

### පරිපාලනය.

2. (1) මෙම ආඥාපනතේ කාර්‍ය සඳහා සථිර ලේකම් තැන පුරාවිද්‍යා ද්‍රව්‍ය පාලක තැන වන්නේ ය. — පුරාවිද්‍යා ද්‍රව්‍ය පාලක තැන සහ සහකාර පාලකවරු.

(2) මෙම ආඥාපනතේ කාර්‍ය සඳහා අමාත්‍යාංශයේ සෑම සහකාර ලේකම් කෙනෙක් ම, පුරාවිද්‍යා ද්‍රව්‍ය සහකාර ලේකම් කෙනෙක් වන්නේ ය.

3. (1) පුරාවිද්‍යා ද්‍රව්‍ය පරීක්ෂකවරුන් වශයෙන් හෝ එබන්දන් මෙන් වැඩ බැලීමට හෝ නමින් හෝ නිලයෙන් පත් කිරීමටද අතිකුත් නිලධාරීන් හා සේවකයින් ද මෙම ආඥාපනතේ කාර්‍ය සඳහා අවශ්‍ය විය හැකි සංඛ්‍යාවක් පත් කර ගැනීමටද පිළිවන. — පුරාවිද්‍යා ද්‍රව්‍ය පරීක්ෂකයින් සහ අනිකුත් කාර්‍ය මණ්ඩලය.

(2) සරයන් කෙනෙකුගේ පදවියට පහත් නොවූ සෑම පොලිස් නිලධාරියෙක් ම මෙම ආඥාපනතේ කාර්‍ය සඳහා පුරාවිද්‍යා ද්‍රව්‍ය පරීක්ෂක කෙනෙකු මෙන් සලකනු ලැබේ.

4. පුරාවිද්‍යා ද්‍රව්‍ය පරීක්ෂකයකුගේ බලතල, පාලක තැනට හෝ සහකාර පාලක කෙනෙකුට හෝ සිය දිස්ත්‍රික්කය ඇතුළත දී බලපත්‍ර බලධරයකුට හෝ පාවිච්චි කළ හැකි ය.

5. (1) සෑම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකයෙක් ම සිය බලතල පාවිච්චි කිරීමේ දී හෝ යුතුකම් ඉටු කිරීමේ දී, පාලකතැනගේ සාමාන්‍ය හෝ විශේෂ නියමයන්ට යටත් වන්නේ ය.

(2) සෑම බලපත්‍ර බලධරයෙක් ම, සිය බලතල පාවිච්චි කිරීමේ දී හා යුතුකම් ඉටු කිරීමේ දී පාලක තැනගේ සාමාන්‍ය හෝ විශේෂ නියමයන්ට යටත් වන්නේය.

6. බලපත්‍ර බලධරයෙකුගේ බලතල හා යුතුකම් ඒ සඳහා එබඳු බලධරයකු විසින් ලිපියක මාර්ගයෙන් දෙනු ලැබූ බලයක් අනුව කවර ආණ්ඩුවේ නිලධාරියකුට වුව ද පාවිච්චි කළ හැක්කේ ය.

## II වෙනි කාණ්ඩය.

### වාර්තා, බලපත්‍ර හා අවසර පත්‍ර.

7. (1) (2) වෙනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයේ දී තමාගේ සවාමිත්වයේ හෝ පාලනය යටතේ යම්කිසි පුපුරණ ද්‍රව්‍ය තොගයක් ඇතිව සිටින සෑම තැනැත්තෙක්ම එකී දිනයේ සිට දින දහහතරක් ඇතුළත එම තොගය තබා තිබෙන දිස්ත්‍රික්කයේ බලපත්‍ර බලධරයා වෙත පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් සැපයිය යුතු ය:—

(i) එකී තැනැත්තාගේ නම හා ලිපිනය,

(ii) එකී තොගයේ අන්දම හා ප්‍රමාණය, හා

(iii) එකී තොගය තබා තිබෙන්නේ කවර කාර්‍යයක් සඳහාද යන්න හා එය තබා තිබෙන ස්ථානය ද වේ.

(2) නියමිත ප්‍රමාණයට වැඩි නොවන ප්‍රමාණයක ආරක්ෂක පත්තරවත් හෝ ගිනිකෙළි සම්බන්ධයෙන්, (1) වෙනි උප වගන්තියේ විධිවිධාන අදාළ නො වන්නේ ය.

8. ඒ සඳහා බලපත්‍රයක් ලබා ගත් තැනැත්තකු හැර, අන්කිසි තැනැත්තෙකු විසින් කිසිම පුපුරණ ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වීම හෝ සෑදීම හෝ විකිණීම හෝ සැපයීම නො කළ යුතු ය.

Repeled and new Sec 3 of Act- NO 33 of 1966.

9. (1) බලපත්‍රයකින් ලබා ගන්නා ලද බලය යටතේ හැර, කිසිදු පුපුරණ ද්‍රව්‍යයක් සාදන්නෙකුගේ හෝ මෙරටට ගෙන්වන්නෙකුගේ හෝ සපයන්නෙකුගේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වා ගෙනයාම හෝ එබඳු ව්‍යාපාරයක් සඳහා පුපුරණ ද්‍රව්‍යයක් ලබා ගැන්ම, සවාමිත්වයේ තබා ගැන්ම, ගෙනයාම හෝ පාවිච්චි කිරීම හෝ කිසිවකු විසින් නො කළ යුතු ය.

(2) 10 වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, අවසර පත්‍රයක් ඇතුව මිස හැර, (1) වෙනි උප වගන්තියේ සඳහන් වෙළඳ

ව්‍යාපාර නොවන අන් කිසි කාර්යයක් සඳහා පුපුරණ ද්‍රව්‍යයක් ලබා ගැනීම, සවාමිත්වයේ තබා ගැනීම, ගෙන යාම හෝ පාවිච්චි කිරීම කිසිවකු විසින් නො කළ යුතු ය.

**10.** නියමිත ප්‍රමාණයට වැඩි නොවන ප්‍රමාණයක ආරක්ෂක පතරොන් හෝ ගිණිකෙළි ලබා ගැනීම, සවාමිත්වයේ තබා ගැනීම, ගෙනයාම හා පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය නො වන්නේ ය.

ආරක්ෂක පතරොන් හා ගිණිකෙළි සම්බන්ධයෙන් අත්හැරීම.

**11.** මෙම ආඥපනත යටතේ පහත සඳහන් කාර්ය සඳහා නියෝග සම්පාදනය කර ගත හැකිය :—

ගිණිකෙළි සම්බන්ධ නියෝග.

(අ) ගිණිකෙළි වර්ග කිරීම ;

(ආ) යම්කිසි ගිණිකෙළි වර්ග සෑදීම, මෙරටට ගෙන්වීම, සවාමිත්වයේ තබා ගැන්ම, පාවිච්චි කිරීම හා සැපයීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම ;

See 6 of Act No 33 of 69

(ඇ) යම්කිසි ගිණිකෙළි වර්ග පැටවීම, බෑම හා ගෙනයාම විධිමත් කිරීම ; සහ

See 6 (3) of act no 33 of 69. New Para. E

(ඈ) යම්කිසි ගිණිකෙළි වර්ග ගබඩා කිරීම, විධිමත් කිරීම ද වේ.

**12.** (1) පුපුරණ ද්‍රව්‍ය සෑදීමේ වෙළඳ ව්‍යාපාරයක් කර ගෙන යෑම පිණිස දෙන ලද බලපත්‍රයකින්, එකී බල පත්‍රයේ සඳහන් කොන්දේසිවලට හා මෙම ආඥපනතේ හා එය යටතේ සම්පාදිත නියෝගවල විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල එකී අවසර පත්‍ර ලැබූ අයට හිමි වන්නේ ය :—

බලපත්‍රවලින් හා අවසර පත්‍රවලින් දෙනු ලැබූ බලය.

See 7 of act No 33 of 69.

(අ) බලපත්‍රයේ සඳහන් වර්ගයට හෝ වර්ගවලට අයත් පුපුරණ ද්‍රව්‍ය සෑදීම ;

(ආ) බලපත්‍රයේ බලය යටතේ සාදන ලද පුපුරණ ද්‍රව්‍ය සවාමිත්වයේ තබා ගැනීම, ගෙන යාම හා විකිණීම හෝ සැපයීම ; සහ

See 7. of act no 33 of

(ඉ) ඉහත කී පරිදි එසේ සෑදීම පිණිස ඒ සඳහා වුවමනා වන ලෙස බලපත්‍රයේ සඳහන් කර ඇති යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක් ලබා ගැනීම, සවාමිත්වයේ තබා ගැන්ම, ගෙන යාම හා පාවිච්චි කිරීමද වේ.

(2) පුපුරණ ද්‍රව්‍ය මෙරටට ගෙන්වන්නෙකුගේ වෙළඳ ව්‍යාපාරය කර ගෙන යෑම සඳහා දෙන ලද බලපත්‍රයකින්, එකී බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට හා මෙම ආඥපනතේ හා එය යටතේ සම්පාදිත නියෝගවල විධිවිධාන වලට යටත්ව, පහත සඳහන් බලතල එකී බලපත්‍රය ලැබූ අයට හිමි වන්නේ ය :—

(අ) බලපත්‍රයේ සඳහන් වර්ගයට හෝ වර්ගවලට අයත් පුපුරණ ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම ; හා

(ආ) බලපත්‍රයේ බලය යටතේ මෙරටට ගෙන්වන ලද පුපුරණ ද්‍රව්‍ය සවාමිත්වයේ තබා තැබීම, ගෙන යාම හා විකිණීම හෝ සැපයීම ද වේ.

(3) පුපුරණ ද්‍රව්‍ය සපයන්නෙකුගේ වෙළඳ ව්‍යාපාරය කරගෙන යාම සඳහා දෙන ලද බලපත්‍රයකින්, එකී බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට හා මෙම ආඥපනතේ හා එය යටතේ සම්පාදිත නියෝගවල විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල එකී බලපත්‍රය ලැබූ අයට හිමි වන්නේ ය:—

Sec. 7 (5) (6) (7) of act No 33 of 1969

(අ) බලපත්‍රයේ සඳහන් කර තිබෙන වර්ගයේ හෝ වර්ගවල පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීම ; හා

(ආ) බලපත්‍රයේ බලය යටතේ ලබා ගන්නා ලද පුපුරණ ද්‍රව්‍ය සවාමිත්වයේ තබා ගැන්ම, ගෙන යාම හා විකිණීම හෝ සැපයීම ද වේ.

(4) අවසර පත්‍රයේ සඳහන් කොන්දේසිවලට ද මෙම ආඥපනතේ හා මෙම ආඥපනත යටතේ සම්පාදිත නියෝගවල විධිවිධානවලට ද යටත්ව, එකී අවසර පත්‍රයේ සඳහන් වර්ගයේ පුපුරණ ද්‍රව්‍ය එහි ම සඳහන් කාර්‍යය සඳහා ලබා ගැන්මට, සවාමිත්වයේ තබා ගැන්මට, ගෙනයාමට හා පාවිච්චි කිරීමට, අවසර පත්‍රයක් ලැබූ තැනැත්තාට එයින් බලය ලැබෙන්නේය.

බලපත්‍ර හා අවසර පත්‍ර ලබා ගැන්ම සඳහා ඉල්ලුම් පත්‍ර.

13. (1) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ලබා ගැන්ම සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක් ම—

(අ) එය හා සම්බන්ධ පුපුරණ ද්‍රව්‍ය තබන්ට යෙදෙන දිස්ත්‍රික්කය පිළිබඳ බලපත්‍ර බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ආ) එම ඉල්ලීමට සුදුසු වන නියමිත ආකෘති පත්‍රවලින් එකකට සාරානුකූලව පිළියෙළ කළ යුතු ය ;

(ඇ) එකී ආකෘති පත්‍රයෙන් අවශ්‍ය වන විස්තර ප්‍රකාශ කළ යුතු ය ;

(ඈ) ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

(2) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ලබා ගැන්මට ඉල්ලුම් පත්‍රයක් එවන ඉල්ලුම්කරු විසින්, එකී ඉල්ලීම පිළිබඳව ක්‍රියා කළ හැකි වීම පිණිස බලපත්‍ර බලධරයා වෙත සැපයිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලබන අන්දමේ තොරතුරු, සැපයිය යුතු ය. ඉදින් එකී නියමය අනුව ක්‍රියා කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වුවහොත්, බලපත්‍රය හෝ අවසර පත්‍රය ඔහුට දීම ප්‍රතික්ෂෙප කිරීමට බලපත්‍ර බලධරයාට පිළිවන.

බලපත්‍ර හා අවසර පත්‍ර ලබා ගැන්මේ සුදුසු කම.

14. පහත සඳහන් අන්දමේ කවර තැනැත්තෙකුට වුව ද, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නො දිය යුතු ය:—

(අ) අපරාධ වැළැක්වීමේ ආඥපනතේ අර්ථානුකූලව ලියා පදිංචි කළ අපරාධකරුවකු වන තැනැත්තෙක් ; හෝ

(ආ) අවුරුදු දහ අටක් වයස් නො පිරුණු තැනැත්තෙක් ; හෝ

(ඇ) කලින් දෙන ලද බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් තහනම් කරනු ලැබූ තැනැත්තෙක් ද වේ.

(2) (1) වෙනි උප වගන්තිය කඩ කරමින් දෙන ලද අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් අවලංගු වන්නේ ය.

(3) යම්කිසි නැනැත්තෙකුට—

(අ) ඉදින්, ඔහුට කලින් දෙන ලද බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් අවලංගු කරන ලද නම් හෝ තහනම් කරන ලද නම්; නැතහොත්

(ආ) ඉදින්, ඔහු මෙම ආඥාපනත යටතේ වරදක් සම්බන්ධයෙන් හෝ තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍ය සවාමිත්වයේ තබා ගැන්ම හෝ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අන්කිසි ලිපිගත නීතියක් යටතේ වරදක් කිරීම හෝ එබඳු වරදක් කිරීමේ දී තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍ය පාවිච්චි කිරීම හෝ සම්බන්ධයෙන් වරදකාරයා කරනු ලැබුවහොත් ;

act no 33 of 69 Sec 8 B. 1 c/3

Penal code
Ex Act
Offensive weapons act
see 1966 act

එබඳු නැනැත්තෙකුට බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

15. නියම කර තිබෙන ගාස්තුවලින් ඒ ඒ අවස්ථාවට සුදුසු අන්දමේ ගාස්තුවක් ගෙවූ විටක හැර, කිසි නැනැත්තෙකුට බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දෙනු නො ලැබේ. බලපත්‍ර හා අවසර පත්‍ර සඳහා ගාස්තු.

16. (1) මෙම ආඥාපනතේ මීට ඉහතින් සඳහන් විධිවිධානවලට යටත්ව, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ඉල්ලා සිටින ඉල්ලුම්කරුවකුට එය දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිය අභිමතය පරිදි කිරීමට බලපත්‍ර බලධරයකුට පිළිවන. බලපත්‍ර හා අවසර පත්‍ර දීම.

(2) තමාට අවශ්‍ය ලෙස හැඟි යන අන්දමේ කොන්දේසිවලට යටත්ව, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දීමට බලපත්‍ර බලධරයකුට පිළිවන.

(3) (1) වෙනි උප වගන්තිය යටතේ සිය අභිමතය පාවිච්චි කිරීමේ දී, අවස්ථාවට අදාළ වන සියලු ම කරුණු ගැන ද විශේෂයෙන්ම බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ලැබුවකු වීමට ඉල්ලුම්කරුගේ සුදුසුකම ගැන ද බලපත්‍ර බලධරයා විසින් සැලකිල්ල දැක්විය යුතු ය.

(4) අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර බලධරයකු බැස ගන්නා තීරණය, මෙම ආඥාපනත යටතේ බලපත්‍ර බලධරයාගේ තීරණයට විරුඬව ගන්නා ලද ඇපෑලක තීරණයකට යටත්ව, අවසාන හා තීරණාත්මක වන අතර කිසිම උසාවියක දී එය ප්‍රශ්න නො කළ යුතු වන්නේ ය.

17. (1) (3) වෙනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, සෑම බලපත්‍රයක්ම ඊට කලින් එය අවලංගු කරනු නො ලැබුයේ නම්, එය වලංගු වන ලෙස ප්‍රකාශ කරනු ලැබූ දිනට පසුව පැමිණෙන ජූනි මාසයේ දහතුන්වෙනි දින අවසන් වන්නේ ය. බලපත්‍රවල හා අවසර පත්‍රවල කාල සීමාව.

(2) (3) වෙනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, සෑම අවසර පත්‍රයක්ම, එය ඊට කලින් අවලංගු නො කරන ලද නම්, එහි සඳහන් කර ඇති කාලය තුළදී වලංගුව පවතින්නේ ය.

(3) යම්කිසි කාල සීමාවක් තුළදී තහනම් කර තිබෙන යම්කිසි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් එකී කාලය තුළ දී බලපවත්වනු නො ලැබේ.

බලපත්‍ර අළුත් කිරීම.

18. (1) බලපත්‍රයක් අවසන්වීමේ දිනයට දින තිහකට කලින් එකී බලපත්‍රය නිකුත් කළ බලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ඔහුට එය අළුත් කළ හැකිය. අළුත් කරනු ලැබූ බලපත්‍රයක්, කලින් එය අවලංගු කරනු නො ලැබූයේ නම්, අළුත් කිරීමට ප්‍රථම එය අවසන් වන දිනයට පසුව පැමිණෙන ජූනි මාසයේ දහතුන්වෙනි දින අවසන් වන්නේ ය.

(2) 13 වෙනි වගන්තියේ සිට 16 වෙනි වගන්තිය දක්වා වගන්තිවල (එම වගන්ති දෙක ද ඇතුළුව.) විධිවිධාන, බලපත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් ද, බලපත්‍රයක් දීම සම්බන්ධයෙන් ඒවා අදාළ වන පරිද්දෙන් සුදුසු වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

ප්‍රතික්ෂේප කිරීම ඉල්ලුම්කරුට දන්වීම.

19. බලපත්‍ර බලධරයකු බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දීම හෝ බලපත්‍රයක් අළුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කරන විට, බලපත්‍රය හෝ අවසර පත්‍රය සඳහා හෝ අළුත් කිරීම සඳහා ඉල්ලුම් කරන්නා වෙත එසේ ප්‍රතික්ෂේප කිරීම දන්වන දැන්වීමක් දීමට ඔහු විසින් සැලැස්විය යුතු ය. එකී දැන්වීමේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඇතුළත් කළ යුතු ය.

බලපත්‍ර හා අවසර පත්‍ර සඳහා අදාළ වන සාමාන්‍ය කොන්දේසි.

20. සෑම බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් ම පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතු ය:—

(අ) බලපත්‍රය හෝ අවසර පත්‍රය අනුව බලපත්‍රකරුගේ හෝ අවසර පත්‍ර කරුගේ සවාමිත්වයේ හෝ පාලනය යටතේ තිබෙන සියලු ම පුපුරණ ද්‍රව්‍ය මෙම ආඥාපනත යටතේ සම්පාදිත නියෝග අනුව පැටවිය යුතු ද, බෑ යුතු ද, ගෙන යා යුතු ද, තැබිය යුතු ද වන්නේ ය;

(ආ) එබඳු කිසිම පුපුරණ ද්‍රව්‍යයක් බලපත්‍රයෙන් හෝ අවසර පත්‍රයෙන් බලය දී තිබෙන පරිදි හැර අන් අන්දමකින් පාවිච්චි නො කළ යුතු ද, අයිතිකර නො ගත යුතු ද වන්නේ ය;

(ඉ) බලපත්‍රකරු හෝ අවසර පත්‍ර කරු විසින් එම පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් එම බලපත්‍රය හෝ අවසර පත්‍රය දුන් බලපත්‍ර බලධරයාට වුවමනා ලෙස අනුමත කරන ලද අන්දමේ ආකෘතියක ලේඛන තබා ගත යුතු ය. එසේ ම;

(ඊ) එබඳු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් එම බලපත්‍ර බලධරයාට අවශ්‍ය වන අන්දමේ වාර්තා හෝ අතිකුත් තොරතුරු බලපත්‍රකරු හෝ අවසර පත්‍ර කරු විසින් එකී බලපත්‍ර බලධරයා වෙත සැපයිය යුතු ය.

බලපත්‍ර හා අවසර පත්‍ර තහනම් කිරීම හෝ අවලංගු කිරීම.

21. බලපත්‍රකරුවකු හෝ අවසරපත්‍ර කරුවකු මෙම ආඥාපනත යටතේ වරදකට හෝ තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් සවාමිත්වයේ තබා ගැන්ම හෝ පාවිච්චි කිරීම හැනහොත් වරද කිරීමේ දී තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අන් කිසි ලිපිගත නීතියක් යටතේ වරදකට හෝ යම් උසාවියක් විසින් වරදකාරයා කරනු ලැබුවහොත්, එකී බලපත්‍රකරුට හෝ අවසර පත්‍රකරුට බලපත්‍රය හෝ අවසර පත්‍රය දුන් බලපත්‍ර බලධරයා වෙත

එකී තැනැත්තා වරදකාරයා කිරීම දන්වන දැන්වීමක් දීමට එකී උසාවිය විසින් සැලැස්විය යුතු ය. එම බලපත්‍ර බලධරයාට එකී දැන්වීම ලැබුණු විට, ලිඛිත ආඥාවක් කරමින් එහි සඳහන් කාලසීමාව තුළ එකී බලපත්‍රය හෝ අවසර පත්‍රය තහනම් කිරීමට නැතහොත් එකී බලය හෝ අවසර පත්‍රය අවලංගු කිරීමට ඔහුට පිළිවන. බලපත්‍රය හෝ අවසර පත්‍රය තහනම් කිරීම හෝ අවලංගු කිරීම සඳහා ඇති වූ හේතු ද එකී ආඥාවේ සඳහන් කළ යුතු ය.

(2) (1) වෙනි උප වගන්තිය යටතේ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් තහනම් කරමින් හෝ අවලංගු කරමින් බලපත්‍ර බලධරයකු විසින් ආඥාවක් කිරීමේ දී, එකී ආඥාව පිළිබඳ දැන්වීමක් එම බලපත්‍ර කරුට හෝ අවසර පත්‍රකරුට දීමට ඔහු සැලැස්විය යුතු ය.

(3) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් තහනම් කරමින් හෝ අවලංගු කරමින් (1) වෙනි උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක්, එකී ආඥාවට විරුඬව මෙම ආඥාපනත යටතේ ගන්නා ලද ඇපෑලක තීරණයකට යටත්ව, අවසාන හා තීරණාත්මක වන අතර ඒ පිළිබඳව කිසිම උසාවියක දී ඊට විරුඬව ප්‍රශ්න නො කළ යුතු ය.

(4) අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් තහනම් කරමින් හෝ අවලංගු කරමින් (1) වෙනි උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක්, එකී ආඥාවට විරුද්ධව මෙම ආඥාපනත යටතේ ඇපෑල් ගැනීමට ඉඩ දී තිබෙන කාල සීමාව ඇතුළත දී ද, ඉදින් එබඳු ඇපෑලක් ඉදිරිපත් කරන ලද නම්, ඇපෑල අවිනිශ්චිතව තිබෙන කාලය තුළදී ද බල පවත්වනු නො ලැබේ. එහෙත්, ඇපෑල් ගැනීමට ඉඩ දී තිබෙන කාලය තුළ දී හා ඇපෑල එසේ අවිනිශ්චිතව තිබෙන කාලය තුළ දී එම බලපත්‍රයෙන් හෝ අවසර පත්‍රයෙන් බලය දෙන ලද කවර කාර්‍යයක් වුව ද, නො කළ යුතු ය. ඇපෑල් ගැනීම සඳහා ඉඩ හැර තිබෙන කාලය ඇතුළත දී එබඳු ඇපෑලක් ඉදිරිපත් කර නොමැති විට, එබඳු ආඥාවක් එම කාලය අවසන්වීමේ දී බල පවත් වන්නේ ය. එසේම, එබඳු ඇපෑලක් කරනු ලැබ එය නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත්, එම ඇපෑල නිෂ්ප්‍රභ කරනු ලැබූ දිනට පසු දින එම ආඥාව බල පවත් වන්නේ ය.

22. බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සඳහා හෝ අවසර පත්‍රයක් අළුත් කිරීම සඳහා හෝ ඉල්ලුම් කරන්නෙකුගේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් බලපත්‍ර බලධරයකු විසින් කරන ලද තීරණයකින් අතෘප්ත වූවෙකුට හෝ තමාගේ බලපත්‍රය හෝ අවසර පත්‍රය තහනම් කරමින් හෝ අවලංගු කරමින් බලපත්‍ර බලධරයකු විසින් කරන ලද ආඥාවකින් අතෘප්ත වූ බලපත්‍රකරුවකුට හෝ අවසරපත්‍ර කරුවකුට හෝ එකී තීරණය හෝ ආඥාව පිළිබඳ දැන්වීම භාර කරනු ලැබ දින දහහතරක් ඇතුළත දී එකී තීරණයට හෝ ආඥාවට විරුඬව පාලක තැන වෙත ඇපෑල් ගත හැකි ය. ඇපෑල්.

(2) (1) වෙනි උප වගන්තිය යටතේ ඇපෑලක් සලකා බැලීමේ දී අවස්ථාවට අදාළ වන සියලු කරුණු ගැන ද විශේෂයෙන් ම බලපත්‍ර කරුවකු හෝ අවසරපත්‍ර කරුවකු ලෙස ක්‍රියා කරගන යාමට ඇපෑල් කරුගේ ඇති සුදුසුකම ගැන ද පාලකතැන කල්පනා කළ යුතු ය.

(3) මෙම වගන්තියේ මීට ඉහත සඳහන් විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද ඇපෑලක දී පාලක තැනගේ තීරණය අවසාන හා තීරණාත්මක වන අතර, ඊට විරුද්ධව කවර උසාවියක දී වුව ද, ප්‍රශ්න නො කළ යුතු ය.

නැසීගිය අවසර පත්‍ර කරුවකුගේ වෙළඳ ව්‍යාපාරය කරගෙනයාම.

23. බලපත්‍රකරුවකු නැසිගිය අවස්ථාවක දී—

(අ) ඔහුගේ නීති නියෝජිතයා හෝ ඉදින් එබඳු නියෝජිතයකු නොමැති නම්, පුපුරණ ද්‍රව්‍ය පිළිබඳව නැසිගිය තැනැත්තාගේ වෙළඳ ව්‍යාපාරයේ පාලනය හා කළමනාකාරත්වය ඇතිව සිටින තැනැත්තා හෝ පාලකතැනට ද එකී බලපත්‍රකරුට බලපත්‍රය දුන් බලපත්‍ර බලධරයාට ද එකී මරණය හා මරණය සිදු වූ දිනය ද වහාම ලියා දැන්විය යුතු ය ; එසේ ම

(ආ) එබඳු නියෝජිතයකුට හෝ ඉදින් එබඳු නියෝජිතයකු නොමැති නම්, එම වෙළඳ ව්‍යාපාරයේ පාලනය හා කළමනාකාරත්වය ගෙන යන තැනැත්තාට, එසේ කිරීමට බලපත්‍රයකින් තමාට බලය ලැබී නොමැති වුව ද, එකී මරණය සිදු වූ දින සිට මාසයකට නො වැඩි කාලයක් එම ව්‍යාපාරය ගෙන යා හැකි ය. තව ද, එම කාලය ඇතුළත බලපත්‍රයක් නොමැතිව, එම ව්‍යාපාරය කරගන යාම මෙම් ආඥපනත යටතේ වරදක් නො වන්නේ ය.

බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් බලපැවැත්වීම නැවතුණ විට, පුපුරණ ද්‍රව්‍ය වලින් නිදහස් වීමට නියම.

24. සිය බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ බලය යටතේ පුපුරණ ද්‍රව්‍ය කිසිවක් යම්කිසි බලපත්‍ර කරුවකු හෝ අවසරපත්‍ර කරුවකු සිය සවාමිත්වයේ තබා සිටිය දී එකී බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ බලපැවැත්වීම අවසන් වුවහොත් හෝ ඔහු මියගිය හොත්, ඔහුගේ නීති නියෝජිත තැන හෝ එබඳු නීති නියෝජිත කෙනෙකු නොමැති නම්, එකී නැසිගිය තැනැත්තාගේ පුපුරණ ද්‍රව්‍ය ව්‍යාපාරයේ පාලනය හා කළමනාකාරත්වය ඇතිව සිටින තැනැත්තා එම පුපුරණ ද්‍රව්‍යවලින් නිදහස්වීම සඳහා එකී බලපත්‍රය හෝ අවසරපත්‍රය දුන් බලපත්‍ර බලධරයා විසින් ඔහුට නිකුත් කරනු ලැබිය හැකි නියම අනුව ක්‍රියා කළ යුතු ය.

## III වෙනි කාණ්ඩය.

**පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකවරුන්ගේ බලතල හා වැරදි හා දණ්ඩන.**

පරීක්ෂා කිරීමේ හා සෝදිසි කිරීමේ බලතල.

25. පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකයකුට—

(අ) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් යටතේ යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක් සාදන, සවාමිත්වයේ තබා තිබෙන, පාවිච්චි කරන, සපයන, ගෙන යන හෝ මෙරටට ගෙන්වන යම් ස්ථානයකට ඇතුළුව එය පරීක්ෂා කිරීම හෝ එබන්දක් කරන වාහනයක් හෝ යාත්‍රාවක් නවත්වා ඊට ඇතුළුව එය පරීක්ෂා කිරීම හෝ මෙම ආඥපනත හෝ මෙම ආඥපනත යටතේ සම්පාදිත යම්කිසි නියෝගයක් කඩ කරමින් යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක් සෑදීම, සවාමිත්වයේ

තබා සිටීම, පාවිච්චි කිරීම, සැපයීම, ගෙනයාම හෝ මෙරටට ගෙන්වීම කරන ලදැයි හෝ කරනු ලබයි හෝ සැක කරනු ලැබූ ස්ථානයකට ඇතුල්ව එය පරීක්ෂා කිරීම හෝ එබඳු වාහනයක් හෝ යාත්‍රාවක් නවත්වා ඊට ඇතුල්ව එය පරීක්ෂා කිරීම හෝ කළ හැකි ය;

(ආ) එබඳු ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක පුපුරණ ද්‍රව්‍ය තිබේ දැයි පරීක්ෂා කළ හැකි ය;

(ඇ) එබඳු ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක තිබී සම්භවුන යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක ආදර්ශ කොටස් ඒවායේ වටිනාකම ගෙවා ගත හැකි ය. එසේ ම;

(ඈ) මෙම ආඥාපනත යටතේ තබා ගෙන තිබෙන ලේඛන කිසිවක් පරීක්ෂා කොට ඒවායින් පිටපත් ගත හැකි ය.

යම් යම් දේවල් අල්ලා තහනම් කිරීමේ බලය.

26. (1) මෙම ආඥාපනත යටතේ යම් වරදක් කරන ලදැයි හෝ කරනු ලැබේ යයි හෝ විශ්වාස කිරීමට යම්කිසි පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකයකුට හේතු ඇති වුවහොත්, එම වරද කරනු ලැබීමට හෝ කර ගෙන යාමට සම්බන්ධ ලෙස විශ්වාස කරන හෝ එම වරද කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කරන ලදැයි හෝ පාවිච්චි කරන්නේ යයි විශ්වාස කරන යම්කිසි දෙයක් අල්ලා තහනම් කිරීමට ඔහුට පිළිවන.

(2) පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකයකු (1) වෙනි උප වගන්තිය යටතේ යම්කිසි ද්‍රව්‍යයක් අල්ලා තහනම් කළ විට, එකී ද්‍රව්‍යය අල්ලා තහනම් කළ ස්ථානය ඇතුළත් අධිකරණ බලසීමාවේ මහේස්ත්‍රාත් උසාවිය ඉදිරියට එම ද්‍රව්‍යය හැකි පමණ ඉක්මණින් ඔහු විසින් ගෙන ගිය යුතු ය. එම ද්‍රව්‍යය උසාවියට ඉදිරිපත් කළ ඉක්බිති උසාවිය විසින්—

(අ) (3) වෙනි උප වගන්තිය යටතේ ඒ පිළිබඳව ක්‍රියා කොට අවසන් කරන තෙක් එය ආරක්ෂාවේ තැබීම සම්බන්ධයෙන්, සුදුසු ආඥාවක් කළ යුතු ය. එසේ ම,

(ආ) උසාවියේ ම ඕනෑකමින් හෝ එබඳු පරීක්ෂකයකුගේ හෝ එම ද්‍රව්‍යය සවාමිත්වයේ තිබී අල්ලා ගනු ලැබූයේ යම් තැනැත්තෙකුගෙන් ද එම තැනැත්තාගේ හෝ ඉල්ලීම පිට, ඉදින් එම ද්‍රව්‍යය පුපුරණ ද්‍රව්‍යයක් නම් නැතහොත් පුපුරණ ද්‍රව්‍යයක් ලෙස සැක කරනු ලැබේ නම්, එයින් ආදර්ශ කොටසක් පරීක්ෂා කිරීම සඳහාත්, පරීක්ෂා කොට එහි ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම සඳහාත් ආණ්ඩුවේ රස පරීක්ෂක තැන වෙත යැවීමට සැලැස්වීම ද කළ යුතු ය.

(3) (1) වෙනි උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකුගේ සවාමිත්වයේ තිබී යම් ද්‍රව්‍යයක් අල්ලා ගත් විට—

(අ) එසේ අල්ලා ගත් දිනයේ සිට දවස් 14 ක කාලය ඇතුළත දී එසේ චෝදනා කරන ලද වරද සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කරනු නො ලැබුවේ නම්, එම ද්‍රව්‍යය එකී කාලය ගෙවී ගිය වහාම එකී තැනැත්තාට ආපසු දිය යුතු ය. එසේ ම ;

(ආ) එකී කාල සීමාව ඇතුළත දී එබඳු පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලද්දේ නම්, 28 වෙනි වගන්තිය යටතේ එම ද්‍රව්‍ය රාජ සන්තක කළහොත් විනා, එකී පැමිණිල්ලේ අවසාන නිරණය කරනු ලැබූ වහාම එකී තැනැත්තාට එය ආපසු දිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

27. (1) පහත සඳහන් ක්‍රියා කරන යම් තැනැත්තෙකු වරදකට වරදකාරයා වන අතර, මහේස්ත්‍රාත් කෙනෙකු ඉදිරියේ අසා නිමවන නඩුවකින් වැරදිකාරයා වීමේදී රුපියල් 1000කට නො වැඩි දඩයකට හෝ අවුරුද්දකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගතවීමට හෝ එකී දඩය ය, බන්ධනාගාර ගතවීම ය, යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් වන්නේ ය:—

Amd 33 of 69 Sec 14 (1) B 2 years.

A (අ) මෙම ආඥපනතේ හෝ ඒ යටතේ සම්පාදිත යම්කිසි නියෝගයක හෝ යම් විධිවිධානයක් කඩ කිරීම හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම ;

B (ආ) බලපත්‍රයක අඩංගු යම්කිසි කොන්දේසියක් කඩ කරමින් ක්‍රියා කිරීම නැතහොත් ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම ;

C (ඉ) මෙම ආඥපනත යටතේ බලතල පාවිච්චි කරන යම්කිසි නිලධාරියකු විසින් කරන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම ;

D (ඊ) මෙම ආඥපනත යටතේ සිය බලතල පාවිච්චි කරන්නා වූ හෝ යුතුකම් ඉෂ්ට කරන්නා වූ යම්කිසි නිලධාරියකුට අවහිර කිරීම හෝ විරුඬවීම ද වේ.

(2) යම්කිසි තැනැත්තෙක්—

A (අ) මෙම ආඥපනතේ හෝ ඒ යටතේ සම්පාදිත නියෝගයක හෝ යම්කිසි විධිවිධානයක් කඩ කරමින් ක්‍රියා කිරීම හෝ එය අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම ද, නැතහොත් ;

B (ආ) යම්කිසි බලපත්‍රයක ඇතුළත් යම් කොන්දේසියක් කඩ කරමින් ක්‍රියා කිරීම හෝ එය අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම ද ;

කළහොත්, (1) වෙනි උප වගන්තිය යටතේ ඔහුට විරුද්ධව නියම කළ හැකි අනිකුත් දණ්ඩනවලට අතිරේකව, එසේ වරදකාරයා කිරීමෙන් පසුවත් එකී විධිවිධානය කඩ කිරීම හෝ එය අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම් කරනු ලැබූ එක් එක් දිනයට රුපියල් සියය ගණනේ දඩයකට ද ඔහු යටතේ වන්නේ ය.

ද්‍රව්‍ය රාජසන්තක කිරීම.

G.P. 21/ Part 12 13

28. මෙම ආඥපනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකු වරදකාරයා කිරීමේ දී එකී වරද කිරීමට හේතු වූ හෝ එකී වරද කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් ද්‍රව්‍යයක් රාජසන්තක කරමින් ආඥාවක් කිරීමට මහේස්ත්‍රාත් තැනට පිළිවන.

මෙහි සඳහන් වැරදි වරෙන්තුවක් නොමැතිව වරදකරු ඇල්ලිය හැකි වැරදි බව.

29. අපරාධ නඩු විධාන සංග්‍රහයේ (1) වෙනි උප ලේඛනයේ කුමක් සඳහන්ව තිබුණ ද, මෙම ආඥපනත යටතේ කරන ලද සෑම වරදක් ම, එම සංග්‍රහයේ අර්ථානුකූලව වරෙන්තුවක් නොමැතිව වරදකරු ඇල්ලිය හැකි වරදක් වන්නේ ය.

30. (1) රජය විසින් හෝ රජය වෙනුවෙන් තබා ගනු ලබන පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම ආඥාපනත අදාළ නො වන්නේ ය.

රජය විසින් හෝ රජය වෙනුවෙන් තබා ගනු ලබන පුපුරණ ද්‍රව්‍ය.

(2) ගැසට් පත්‍රයේ ආඥාවක් පළ කිරීමෙන්, (1) වෙනි උප වගන්තියේ සඳහන් පුපුරණ ද්‍රව්‍ය පැටවීම, බෑම, ගෙන යාම හා ගබඩා කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැපයීමට ඇමතිවරයාට පිළිවන.

(3) (2) වෙනි උප වගන්තිය යටතේ කරන ලද යම්කිසි ආඥාවක විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදකට වරදකාරයා වන අතර, මහේස්ත්‍රාත් කෙනෙකු ඉදිරියේ අසා නිමවන නඩුවකින් වැරදිකාරයා වීමේ දී රුපියල් සියයකට වැඩි නො වන දඩයකට ද ඔහු යටත් වන්නේ ය.

## IV වෙනි කාණ්ඩය.

### සාමාන්‍ය.

31. පාලක තැන ද, සෑම සහකාර පාලක කෙනෙක් ද, සෑම බලපත්‍ර බලධරයෙක් ද, සෑම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂකයෙක් ද මෙම ආඥාපනත යටතේ කෙරෙන යම් වරදක් සම්බන්ධයෙන්, අපරාධ නඩු විධාන සංග්‍රහයෙන් පවරන ලද යම්කිසි බලයක් පාවිච්චි කිරීම සඳහා, එකී අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සමාදාන නිලධාරියකු ලෙස සලකනු ලැබේ.

පාලක තැනද සහකාර පාලක වරුද බලපත්‍ර බල ධාරීන් හා පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂක තැනද සමාදාන නිලධාරීන් ලෙස සලකන බව.

32. (1) මෙම ආඥාපනත යටතේ යම් තැනැත්තෙකුට දිය යුතු දැන්වීමක් ඔහු වෙත රෙජිස්ටර් තැපෑලෙන් ලියමනක් යැවීමෙන් කළ යුතු ය.

දැන්වීම් දෙන අන්දම

(2) (1) වෙනි උප වගන්තියේ විධිවිධාන යෙදී ඇති පරිද්දෙන් යම් තැනැත්තෙකුට ලියමනකින් දෙන ලද දැන්වීමක් සාමාන්‍යයෙන් තැපෑලෙන් යවන ලද ලියමනක් භාර කරනු ලබන වේලාවේ දී ඔහු වෙත භාර කරනු ලැබූ ලෙස සලකනු ලැබේ.

33. (1) මෙම ආඥාපනතේ විධිවිධාන ගෙන යාමේ හා ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ කාර්‍ය්‍ය සඳහා නියෝග සම්පාදනය කිරීමට ඇමතිවරයාට පිළිවන.

නියෝග.

(2) (1) වෙනි උප වගන්තියෙන් පැවරී තිබෙන බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිද්දෙන්, මෙම ආඥාපනතින් නියම කළ යුතු ලෙස ප්‍රකාශ කරන ලද හෝ නියමව තිබෙන සියලු කාර්‍ය්‍යයන් සඳහා ද, පනවන ලෙස බල කර තිබෙන හෝ නියම කර තිබෙන සියලු කරුණු සඳහා හා සම්බන්ධයෙන් ද නියෝග පැනවීමට ඇමතිවරයාට පිළිවන.

(3) ඇමතිවරයා විසින් සම්පාදිත සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතු අතර, එසේ ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ දී හෝ එම නියෝගයේ සඳහන් කර තිබෙන යම්කිසි පසු දිනක දී වලංගු බවට පත් වන්නේ ය.

(4) ඇමතිවරයා විසින් සම්පාදිත සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු හැකි පමණ ඉක්මණට, අනුමතිය සඳහා උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

ඉදිරියට ගෙන යා යුතු ය. එසේ අනුමත නො කරන ලද සෑම නියෝගයක් ම එසේ අනුමතිය ප්‍රතික්ෂේප කළ දින සිට අවලංගු කරන ලද්දක් මෙන් සලකනු ලැබේ. එහෙත්, ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට එයින් හානියක් නොවන අතර, එසේ අනුමත කරන ලද සෑම නියෝගයක් ම මෙහිම පනවන ලද්දක් මෙන් වලංගුව බලපවත් වන්නේ ය.

රේගු ආඥා පනත පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාළ වීම.

34. පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් රේගු ආඥාපනත අදාළ වීමේ කාර්‍යය සඳහා—

(අ) මෙම ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගය කින් මෙරටට ගෙන්වීම තහනම් කරන ලද යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක් එකී ආඥාපනතින් තහනම් කරන ලද ද්‍රව්‍ය ලෙස සලකනු ලැබේ. එසේ ම,

(ආ) මෙම ආඥාපනතින් හෝ ඒ යටතේ පනවන ලද නියෝගය කින් හෝ මෙරටට ගෙන්වීම සීමා කරන ලද යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක් එකී ආඥාපනතින් මෙරටට ගෙන්වීම සීමා කරන ලද ද්‍රව්‍යයක් ලෙස සලකනු ලැබේ.

මෙම ආඥා පනත කර්මාන්තශාලා ආඥා පනතට අතිරේක වනු මිස, ඊට හානි කර නොවිය යුතු බව.

35. මෙම ආඥාපනතේ විධිවිධාන 1942කේ අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥාපනතේ විධිවිධාන වලට අතිරේක වනු මිස, ඊට හානිකර නො වන්නේ ය.

140 වෙනි පරිච්ඡේදය අවලංගු කිරීම.

36. පුපුරණ ද්‍රව්‍ය (පරණ) ආඥාපනත මෙයින් අවලංගු කරනු ලැබේ.

පදාර්ථ.

37. මෙම ආඥාපනතේ පද සංසන්දනයෙන් අන්කිසි අර්ථයක් අනවශ්‍ය වූ කල්හි, පහත සඳහන් පාඨයන්හි අර්ථය එහි ම සඳහන් කර තිබෙන පරිදි වන්නේ ය :—

"ද්‍රව්‍ය" යන්නට යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක්, ලේඛනයක්, වාහනයක් හෝ යාත්‍රාවක් ඇතුළත් වන්නේ ය ;

"සහකාර පාලක" යන්නෙන්, පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ සහකාර පාලක කෙනෙක් අදහස් කරනු ලැබේ ;

"පාලක තැන" යන්නෙන් පුපුරණ ද්‍රව්‍ය පාලක තැන අදහස් කරනු ලැබේ ;

"දිස්ත්‍රික්කය" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් කරනු ලැබේ ;

"පුපුරණ ද්‍රව්‍ය" යන්නෙන්, වෙඩි බෙහෙත්, නයිට්‍රෝ-ග්ලිසරින්, ඩයිනමයිට්, වෙඩි කපු, බෝර කුඩු, රසදිය හෝ අනිකුත් ද්‍රව්‍යවලින් ගන්නා පුපුරණ කොටස්, නැතහොත් පිපිරීමක් හෝ ගිණිකෙළි ඇති වීමක් බලාපොරොත්තුවෙන් පාවිච්චි කරන හෝ සාදන අන්කිසි දෙයක් හෝ මිශ්‍රණයක් අදහස් කරන අතර පහත සඳහන් ද්‍රව්‍ය ද ඊට ඇතුළත් වන්නේ ය :—

(අ) මිදුම් සංඥා, ගිණිකෙළි, සේවනුල්, ආකාශ වෙඩිලි, සංඝට්ටන කැප්, පිපිරවීමේ උපකරණ, පතරොම්, සෑම වර්ගයේම වෙඩි තැබීමේ උපකරණ හා මින් ඉහත විස්තර කරන ලද පුපුරණ ද්‍රව්‍යයකින් සකස් කළ හෝ පිළියෙළ කළ සෑම ද්‍රව්‍යයක් ; හා

(ආ) එහි අන්තර්ගත පුපුරණ ද්‍රව්‍යවල හේතුවෙන් ගැසට් පත්‍රයේ ආඥාවක් පළ කරවීමෙන් ඇමතිවරයා විසින් පුපුරණ ද්‍රව්‍යයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ යම් දෙයක් ද වේ.

" තුවක්කුව " යන්නට තුවක්කු ආඥාපනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" බලපත්‍රය " යන්නෙන්, මේ ආඥාපනත යටතේ දෙනු ලබන බලපත්‍රයක් අදහස් වන්නේ ය ;

" බලපත්‍ර බලධරයා " යන්න යම් දිස්ත්‍රික්කයක් සඳහා යෙදීමේ දී එම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තැන, අතිරේක දිසාපති කෙනෙක්, සහකාර දිසාපති කෙනෙක් හෝ අතිරේක සහකාර දිසාපති කෙනෙක් අදහස් වන්නේ ය.

" අවසර පත්‍රය " යන්නෙන් මෙම ආඥාපනත යටතේ දෙන ලද අවසර පත්‍රයක් අදහස් වන්නේ ය ;

" නියමිත " යන්නෙන් මෙම ආඥාපනත යටතේ සම්පාදිත නියෝග වලින් නියම කරනු ලැබීම අදහස් කරයි ;

" ආරක්‍ෂක පතරොම් " යන්නෙන් වෙඩි තැබීමෙන් පසු, එහි කොපුව කුඩා තුවක්කුවෙන් ඉවතට ගත හැකි වූ ද, එක පතරොමක් තවෙකක් සමග ගැටීමෙන් පිපිරීමක් හට ගැන්ම වැළැක්වෙන පරිදි වසන ලද්දවූ ද, කුඩා තුවක්කුවලට පාවිච්චි කරන පතරොම් අදහස් කරයි.